ජලභීතිකාව
මාරාන්තිකයි

# ලෝක ජලභීතිකා දිනය
# සැප්තැම්බර් 28

ඔබේ
සුනඛයා
එන්නත් කරගන්න

## සුනඛ සපාකෑම් වලක්වා ගැනීම



සුනඛයෙකු ගොරවමින් ඔබ වෙතට කිට්ටු වන්නේ නම් ඔබගේ දෑත් දෙපසට එල්ලීමට හරිමින් නිසොල්මන් වන්න. බිම බලා ගන්න. සුනඛයාට ඔබව ඉව කිරීමට ඉඩ හරින්න. මඳ වේලාවකින් සුනඛයා ඉවත්ව යනු ඇත.



සුනඛයෙක් ඔබ වෙත කඩා පනී නම් මුහුණ සහ ශරීරය ආරක්ෂාවන ලෙස බිම වැතිරී හොඳින් වකුටු වන්න.



සුනඛයෙක් කඩා පනින විට ආපසු හැරී දුවන්න එපා !



ආහාර ගනිමින් හෝ නිදා සිටින සුනඛයෙක අසලට ලංවන්න එපා. පැටවුන් රකිමින් සිටිනා සුනඛයෙකුට කිසිවිටෙක කරදර කරන්න එපා. බිය වූ හෝ තිගැස්සුනු විට ඔවුන් සපා කෑමට පෙළඹිය හැක. සුනඛයින් වෙත කෝටු කැබලි හෝ ගල් විසි කරන්න එපා.



සුනඛයින් අසලිදී කලබලකාරී ලෙස හැසිරෙන්නත් එපා. දුවන්නත් එපා



සුනඛයෙකුගේ ඇස් දෙස එක එල්ලේ බලන්න එපා



පැටවුන් රකිමින් සිටිනා සුනඛයෙකු වෙත ලංවන්න එපා. අල්ලන්න එපා. පැටවුන්ගේ ආරක්ෂාව සඳහා මව් සතා ඔබව සපා කෑමට ඉඩ ඇත .

**One Health - Zero Deaths,**
**ජලභීතිකාවෙන් වන මානව මරණ නැති කරලමු .**

World Organisation for Animal Health
Founded as OIE

**One Health - Zero Deaths**
**ජලභීතිකාවෙන් වන මානව මරණ නැති කරලමු.**

# සුනඛයින් පිළිබඳ මනා වැටහීම හා කාරුණ්‍යාව තුළින් ආරක්ෂාවන්න

බැඳ දමා ඇති හෝ වැටකින් එහා පැත්තේ සිටින සුනඛයෙකු වෙත කිට්ටු වන්න එපා





## සුනඛයෙක් සපා කෑ විට ප්‍රතිකාර

- වහාම සබන් භාවිත කරමින් ගලා යන ජලයෙන් විනාඩි 10 ක් සෝදන්න.
- වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට රෝහලකට යන්න. සුනඛ එන්නත් සහතිකය රැගෙන යන්න.
- සුනඛයා වෙන්කර තබන්න. නැතිනම් කෙබඳු දැයි මතක තබා ගන්න.

**සපා කෑවිට තුවාලය සබන් යොදා විනාඩි 10ක් සෝදන්න**

# ඔබේ සුනඛ සුරතලා සනීපයෙන් සහ සතුටෙන් තබන්න

## ජලභීතිකාවට එරෙහිව එන්නත් කරගන්න

ඔබ සුරතලයට ඇති කිරීමට සුනඛයෙකු හෝ බළලෙකු තබා ගන්නේ නම් නොපමාව පශු වෛද්‍යවරයෙකු හමුවී නිර්දේශිත ජලභීතිකා එන්නත පිළිබඳව දැනුවත් වී එන්නත් කරගන්න.






## සත්ත්ව උපත් පාලනය

ශ්‍රී ලංකාවේ සිටින සුනඛයින් සහ බළලුන් සංඛ්‍යාව ඉමහත්ය. මේ තත්වය ජලභීතිකාව රට තුල වේගයෙන් පැතිරීමට හේතුවී ඇත. ඔබගේ සුරතලාගෙන් පැටවුන් බලාපොරොත්තු නොවන්නේ නම් එම සතුන් වද්‍යාකරණය කරගන්න ඒ සඳහා පශු වෛද්‍යවරයෙකු හමුවී උපදෙස් ලබා ගන්න.

වද්‍යාකරණය මගින් ඔබේ සුරතල් සතුන් වඩාත් නීරෝගීව තබා ගත හැකිවනු අතර ඔවුන් මනා හැසිරීමකින් ද යුක්තවනු ඇත.

**අනවශ්‍ය පැටවු උපත් වලක්වා ගනිමු**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ 13 . ගැටඹේ
පේරාදෙණිය.
දුරකථන අංක 081-2388120